# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1993 අංක 8 දරන
# පාසල් සංවර්ධන මණ්ඩල පනත

---

[සහතිකය සටහන් කළේ 1993 පෙබරවාරි මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 පෙබරවාරි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 1.20 යි. තැපැල් ගාස්තුව : රු. 1.[illegible] යි.

# 1993 අංක 8 දරන පාසල් සංවර්ධන මණ්ඩල පනත

[සහතිකය සටහන් කළේ 1993 පෙබරවාරි මස 26 වන දින]

එල්. ඩී.—ඕ. 104/92

**පාසල් සංවර්ධන මණ්ඩල පිහිටුවීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.**

1. මේ පනත 1993 අංක 8 දරන පාසල් සංවර්ධන මණ්ඩල පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

**පාසල් සංවර්ධන මණ්ඩල පිහිටුවීම.**

2. සෑම පාසලක් සඳහා ම (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාසල් සංවර්ධන මණ්ඩලයක්, නියමිත දිනයෙහි සිට ක්‍රියාත්මක වන පරිදි පිහිටුවනු ලැබිය යුතු ය.

**පාසල් සංවර්ධන මණ්ඩලවල සංයුතිය.**

3. පාසලක් සඳහා පිහිටුවන ලද මණ්ඩලයක් පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) පහත සඳහන් නිල බලයෙන් පත්විය යුතු සාමාජිකයන්, එනම්, මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු පාසලේ විදුහල්පතිවරයා සහ එම පාසලේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විදුහල්පතිවරයා ;

(ආ) පහත සඳහන් සෙසු සාමාජිකයන්, එනම් :—

(i) එම පාසලේ විදුහල්පතිවරයා විසින් හෝ ඔහු නොමැති විටක දී එම පාසලේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විදුහල්පතිවරයා විසින් තබා කාර්යය සඳහා කැඳවනු ලබන, පාසලේ උගන්වන ගුරුවරුන්ගේ රැස්වීමක දී, ඒ ගුරුවරුන් විසින් රහස් ඡන්දයෙන් තෝරා පත් කර ගනු ලබන ගුරුවරු තිදෙනෙක්, නැතහොත් ඒ පාසලේ උගන්වන ගුරුවරුන්ගේ සංඛ්‍යාව තිදෙනකු හෝ ඊට අඩුවන අවස්ථාවක, එවිට, ඒ පාසලේ උගන්වන සියලුම ගුරුවරු ;

එසේ තෝරා පත්කර ගනු ලබන ගුරුවරුන් ගණන තුන්දෙනකුට අඩුවන අවස්ථාවක, මණ්ඩලයේ අනික් සාමාජිකයන් විසින් තුන්දෙනා සහ එසේ තෝරා පත් කරනු ලැබූ ගුරුවරුන් ගණන අතර අඩුව පිර වීම සඳහා එම පාසලේ ශිෂ්‍යයන්ගේ දෙමව්පියන්, එම පාසලේ ආදි ශිෂ්‍යයන් සහ පාසල් ප්‍රජාවේ ශුභ සිද්ධිය පතන්නන් අතුරින් අවශ්‍ය සංඛ්‍යාව තෝරා පත්කර ගැනීම හෝ නම් කිරීම කළ යුතු ය. එසේ කිරීමේ දී හැකිතාක් දුරට ඒ සියලු වර්ග සමාන ලෙස මණ්ඩලයෙහි නියෝජනය වන බව සහතික කිරීමට උත්සාහ කළ යුතු ය :

(ii) එම පාසලේ විදුහල්පතිවරයා විසින් හෝ ඔහු නොමැති විටක දී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විදුහල්පතිවරයා විසින් තත්කාර්යය සඳහා කැඳවනු ලබන, තත්කාලයෙහි පාසලෙහි අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දෙමව්පියන්ගේ රැස්වීමක දී ඔවුන් විසින් රහස් ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලබන දෙමව්පියන් තිදෙනෙක් ; එම පාසලේ අධ්‍යාපනය ලබන ශිෂ්‍යයකුගේ නීත්‍යානුකූල භාරකරුවකු මේ වගන්තියේ කාර්යය සඳහා එම ශිෂ්‍යයාගේ දෙමව්පියකු ලෙස සලකනු ලැබිය යුතු ය ;

(iii) පාසලේ ආදි ශිෂ්‍ය සංගමයේ මහා සභා රැස්වීමක දී ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකයන් වන පාසලේ ආදි ශිෂ්‍යයන් අතුරින් රහස් ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලබන, ආදි ශිෂ්‍යයන් තිදෙනෙක් හෝ පාසලෙහි එවැනි ආදි ශිෂ්‍ය සංගමයක් නොමැති අවස්ථාවක දී පාසලේ විදුහල්පතිවරයා විසින් හෝ ඔහු නොමැති විටකදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විදුහල්පතිවරයා විසින් තත් කාර්යය සඳහා කැඳවනු ලබන ආදි ශිෂ්‍යයන්ගේ රැස්වීමක දී රහස් ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලබන ආදි ශිෂ්‍යයන් තිදෙනෙක් ; එවැනි ආදි ශිෂ්‍යයන් නොමැති අවස්ථාවක හෝ පැමිණ සිටින ආදි ශිෂ්‍යයන් ගණන ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාවක, මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් විසින් පාසලේ ගුරුවරුන්, එම පාසලේ ශිෂ්‍යයන්ගේ දෙමව්පියන් සහ පාසල් ප්‍රජාවේ ශුභ සිද්ධිය පතන්නන් අතුරින් සාමාජිකයන් තිදෙනකු තෝරා පත්කර ගැනීම හෝ නම් කිරීම කළ යුතු ය. එසේ කිරීමේ දී හැකි තාක් දුරට ඒ සියලු වර්ග සමාන ලෙස මණ්ඩලයේ නියෝජනය වන බව සහතික කිරීමට උත්සාහ කළ යුතු ය ;

(iv) පාසලේ ප්‍රජාවේ ශුභ සිද්ධිය පතන්නන් නියෝජනය කිරීම සඳහා මණ්ඩලයේ සාමාජිකයන් විසින් තෝරා පත්කර ගනු ලබන එක් තැනැත්තෙක්.

මේ වගන්තිය යටතේ පාසලක් සඳහා පිහිටුවන ලද මණ්ඩලයකට සාමාජිකයන් තෝරා පත්කර ගැනීමේ දී හෝ නම් කිරීමේ දී හැකි තාක් දුරට ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම මණ්ඩලයේ සමාන ලෙස නියෝජනය වන බව සහතික කිරීමට මණ්ඩලය, එම පාසලේ ගුරුවරුන්, එම පාසලේ ශිෂ්‍යයන්ගේ දෙමව්පියන් සහ එම පාසලේ ආදි ශිෂ්‍යයන් උත්සාහ කළ යුතු ය.

මේ ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලබන හෝ නම් කරනු ලබන සාමාජිකයකු මෙහි මින් මතු "තෝරා පත්කර ගත් සාමාජිකයකු" වශයෙන් සඳහන් කරනු ලැබේ.

4. යම් තැනැත්තකු—

සාමාජිකත්වය සඳහා නුසුදුසුකම.

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම්;

(ආ) වයස අවුරුදු දහ අටට අඩු වේ නම්;

(ඇ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් රටක හෝ බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු බවට තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත් නම්;

(ඈ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් රටක හෝ බලපවත්නා යම් නීතියක් යටතේ වස්තු භංගත්වයට පත්වූවකු ලෙස හෝ බංකොලොත් තැනැත්තකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ, නිදහස් කරනු නොලැබූ වස්තු භංගත්වයට පත් වූවකු වන හෝ බංකොලොත් බවට පත්වූවකු වන තැනැත්තකු වේ නම්;

(ඉ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් රටක හෝ අධිකරණයක් විසින් නියම කරන ලද (බන්ධනාගාරගත කිරීමේ අත් හිට වූ දණ්ඩන නියමයක් ඇතුළුව) බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට යටත් වූ තැනැත්තකු වේ නම්; හෝ

(ඊ) ගොඩනැගිලි ඉදිකිරීම් හෝ උපකරණ සැපයීම හෝ සේවා සැලසීම හෝ පිණිස කොන්ත්‍රාත් භාර ගැනීමේ කාර්යය සඳහා අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය හෝ උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය හෝ පළාත් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතේ කොන්ත්‍රාත්කරුවකු ලෙස ලියාපදිංචි වී ඇති තැනැත්තකු වේ නම් හෝ එම තැනැත්තාගේ දෙමව්පියකු, කලත්‍රයකු, සහෝදරයකු හෝ සහෝදරියක වේ නම් හෝ, ගොඩනැගිලි ඉදිකිරීම හෝ උපකරණ සැපයීම හෝ සේවා සැලසීම හෝ පිණිස කොන්ත්‍රාත්තු භාර ගැනීමේ කාර්යය සඳහා අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය හෝ උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය හෝ පළාත් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතේ කොන්ත්‍රාත්කරුවකු ලෙස ලියාපදිංචි වී ඇති සමාගමක හෝ හවුල් ව්‍යාපාරයක සේවයේ නියුක්ත වූ හෝ සම්බන්ධතාවක් ඇත්තාවූ තැනැත්තකු හෝ එම තැනැත්තාගේ දෙමව්පියකු, කලත්‍රයකු හෝ සහෝදරියක වේ නම්

ඒ තැනැත්තා පාසලක් සඳහා පිහිටුවනු ලැබ ඇති මණ්ඩලයක සාමාජිකයකු ලෙස තෝරා පත්කරනු ලැබීමට හෝ නම් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සකු වන්නේ ය.

5. (1) පාසලක් සඳහා පිහිටුවන ලද හෝ සංස්ථාපනය කරන ලද මණ්ඩලයක හෝ අනු කමිටුවක තෝරාපත් කර ගත් හෝ නම් කළ සාමාජිකයකු විසින් කවර හෝ අවස්ථාවක එම පාසලේ විදුහල්පතිවරයා හෝ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විදුහල්පතිවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

මණ්ඩලයක හෝ අනුකමිටුවක තෝරා පත් කර ගත් හෝ නම් කළ සාමාජිකයන්ගේ ධුර කාලය.

(2) පාසලක් සඳහා පිහිටුවන ලද හෝ සංස්ථාපනය කරන ලද මණ්ඩලයක හෝ අනුකමිටුවක තෝරාපත් කර ගත් හෝ නම් කළ සාමාජිකයකු 4 වන වගන්තියේ දක්වා ඇති නුසුදුසුකම්වලින් කිසිවකට යටත් වේ නම් හෝ පාසලේ සුභ සිද්ධියට හානිකර ක්‍රියා කලාපයක් අනුගමනය කිරීම පිළිබඳව වරදකරු වේ නම් එම පාසලේ ගුරුවරුන්, දෙමව්පියන් සහ ආදි ශිෂ්‍යයන් එකතුව යටත් පිරිසෙයින් දහ දෙනකුගේ ඉල්ලීම පිට විදුහල්පතිවරයා විසින් තත් කාර්යය සඳහා කැඳවන ලද එම පාසලේ ගුරුවරුන්ගේ, දෙමව්පියන්ගේ සහ ආදි ශිෂ්‍යයන්ගේ රැස්වීමක දී සම්මත කර ගනු ලබන යෝජනා සම්මතයක් මගින් එම පාසලේ ගුරුවරුන්, දෙමව්පියන් සහ ආදි ශිෂ්‍යයන් විසින් එම සාමාජිකයා ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(3) යම් වර්ෂයක දෙසැම්බර් මස තිස් එක වන දිනය වන විට, ඒ දිනයට පෙරාතුව ම වූ මාස දොළහේ කාලසීමාව ඇතුළත, නැත හොත් ඒ දිනයට පෙරාතුවම වූ මාස දොළහෙන් තමා, අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලයේ හෝ අනුකමිටුවේ සාමාජිකයකුව සිටි කාලසීමාව ඇතුළත හෝ අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලය හෝ අනුකමිටුව විසින් පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාවෙන් යටත් පිරිසෙයින් අඩකට පැමිණීම පැහැර හැර ඇති, පාසලක් සඳහා පිහිටුවා ඇති හෝ සංස්ථාපනය කර ඇති මණ්ඩලයක හෝ අනුකමිටුවක තෝරා පත් කර ගත් හෝ නම් කළ සාමාජිකයකු, ඒ යම් රැස්වීමකට නොපැමිණීයේ රෝගාතුරවීම හේතුකොට ගෙන හෝ ඒ මණ්ඩලයෙන් හෝ අනුකමිටුවෙන් ලබාගත් පූර්ව අවසරය ඇතිව නම් මිස, ඒ සාමාජිකයා එම වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දින සිට බල පැවැත්වෙන පරිදි ඒ මණ්ඩලයේ හෝ අනුකමිටුවේ සාමාජිකයකු වශයෙන් වූ ස්වකීය ධුරය අත්හරින ලදැයි සලකනු ලැබිය යුතු ය.

(4) පාසලක් සඳහා පිහිටුවන ලද හෝ සංස්ථාපනය කරන ලද මණ්ඩලයක හෝ අනුකමිටුවක, පාසලේ ගුරුවරයකුවීමේ හේතුවෙන් තෝරා පත් කර ගත් හෝ නම් කළ සාමාජිකයකු ඔහු ඒ පාසලේ ගුරුවරයකු වශයෙන් සිටීම නතර වූ විට, අවස්ථාවෝචිත පරිදි, එම මණ්ඩලයේ හෝ අනුකමිටුවේ සාමාජිකයකු වශයෙන් ධුරය දැරීම අත්හළ යුතු ය.

(5) පාසලක් සඳහා පිහිටුවන ලද හෝ සංස්ථාපනය කරන ලද මණ්ඩලයක හෝ අනුකමිටුවක, එම පාසලේ ශිෂ්‍යයකුගේ දෙමව්පියකු හෝ භාරකරුවකු වීමේ හේතුවෙන් තෝරාපත් කර ගත් හෝ නම් කළ සාමාජිකයකු, ඔහුගේ දරුවා හෝ රක්ෂිතයා හෝ ඔහුගේ දරුවන්ගෙන් අවසාන දරුවා හෝ ඔහුගේ රක්ෂිතයන්ගෙන් අවසාන රක්ෂිතයා ඒ පාසලේ ශිෂ්‍යයකුව සිටීම නතර වූ විට මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ධුරය දැරීම අත්හළ යුතු ය.

(6) පාසලක් සඳහා පිහිටුවන ලද හෝ සංස්ථාපනය කරන ලද මණ්ඩලයක හෝ අනුකමිටුවක තෝරා පත්කරගත් හෝ නම් කළ සාමාජිකයකු මියයාමෙන්, ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ වෙනත් යම් හේතුවක් නිසා ධුරය දැරීම අත්හරින විටක ඒ සාමාජිකයා වෙනුවෙන් කර්තව්‍ය ඉටු කිරීම සඳහා, අවස්ථාවෝචිත පරිදි, 3 වන වගන්තියේ හෝ 9 වන වගන්තියේ විධිවිධාන

සැලකිල්ලට ගෙන මණ්ඩලය විසින් වෙනත් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය. ධුරය දැරීම අත්හරින සාමාජිකයකු වෙනුවෙන් නම් කරනු ලබන යම් තැනැත්තකු ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(7) පාසලක් සඳහා පිහිටුවා ඇති හෝ සංස්ථාපනය කර ඇති මණ්ඩලයක හෝ අනුකමිටුවක තෝරාපත් කර ගත් හෝ නම් කළ සාමාජිකයකු, රෝගාතුර වීම හෝ වෙනත් අබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා යම් කාලයක් තුළ ස්වකීය ධුරයේ කර්තව්‍ය ඉටුකිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක ඒ කාලය තුළ ඔහු වෙනුවට කර්තව්‍ය ඉටුකිරීම සඳහා වෙනත් සාමාජිකයකු, අවස්ථාවෝචිත පරිදි, 3 වන වගන්තියේ හෝ 9 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන මණ්ඩලය විසින් නම් කරනු ලැබිය හැකි ය.

(8) පාසලක් සඳහා පිහිටුවන ලද හෝ සංස්ථාපනය කරන ලද මණ්ඩලයක හෝ අනුකමිටුවක තෝරා පත් කර ගත් හෝ නම් කළ සාමාජිකයකුගේ ධුර කාලය, මීට පූර්වයෙන් වූ විධිවිධානවලට යටත්ව, අවුරුදු තුනක් විය යුතු අතර ඒ සාමාජිකයා, අවස්ථාවෝචිත පරිදි, නැවත තෝරා පත් කර ගනු ලැබීමට හෝ නම් කරනු ලැබීමට සුදුස්සකු වන්නේ ය.

(9) පාසලක් සඳහා පිහිටුවන ලද හෝ සංස්ථාපනය කරන ලද මණ්ඩලයක හෝ අනුකමිටුවක, සාමාජිකත්වයෙහි පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි සාමාජිකයකු තෝරාපත් කිරීමෙහි ලා හෝ නම් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් ඒ මණ්ඩලයේ හෝ අනුකමිටුවේ යම් ක්‍රියාවක් හෝ තීරණයක් හෝ කටයුත්තක් අවලංගු වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම.

6. (1) පාසලක් සඳහා පිහිටුවා ඇති මණ්ඩලයක් යටත් පිරිසෙයින් සෑම මාස දෙකකට එක් වරක් හෝ රැස්විය යුතු ය.

(2) මණ්ඩලයේ සභාපතිවරයා, එම මණ්ඩලයේ සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විදුහල්පතිවරයා ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු වන අතර, මණ්ඩලයේ යම් රැස්වීමකට විදුහල්පතිවරයා සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විදුහල්පතිවරයා යන දෙදෙනාම පැමිණ නොමැති විටක, විදුහල්පතිවරයා විසින් නම් කරන ලද සාමාජිකයකු එම රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

(3) මණ්ඩලයේ කවර හෝ රැස්වීමක් සඳහා ගණපූරණය, එම රැස්වීමේ මූලාසනය දරන තැනැත්තා ඇතුළුව සාමාජිකයන් හත් දෙනකු විය යුතු ය.

(4) මණ්ඩලයේ කවර හෝ රැස්වීමක දී තීරණය සඳහා උද්ගත වන යම් ප්‍රශ්නයක්, පැමිණ සිටින හා ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. දී ඇති ඡන්ද සංඛ්‍යාව සමාන වූ විටක, මණ්ඩලයේ සභාපතිවරයාට හෝ ඒ රැස්වීමේ මූලාසනය දරන සාමාජිකයාට ඔහුගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) 7 වන වගන්තිය යටතේ පත් කරනු ලබන, මණ්ඩලයේ ලේකම්වරයා විසින් මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් පස් දෙනකුගේ ලිඛිත ඉල්ලීම පිට සහ ඒ ඉල්ලීම මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් එක් සතියක් ඇතුළත මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

(6) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් එහි රැස්වීම් හා ඒ රැස්වීම්වල කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කරගනු ලැබිය හැකි ය.

පාසලක් සඳහා පිහිටුවන ලද මණ්ඩලයක ලේකම්වරයා.

7. පාසලක් සඳහා පිහිටුවන ලද සෑම මණ්ඩලයක ම, ඒ මණ්ඩලය විසින් තෝරා පත් කර ගනු ලබන ලේකම්වරයකු විය යුතු ය. පාසලක ගුරුවරයකු ඒ පාසල සඳහා පිහිටුවනු ලැබූ මණ්ඩලයේ ලේකම් වශයෙන් පත් කරනු ලැබීමට නුසුදුස්සකු විය යුතු ය. මණ්ඩලයේ සභාපතිවරයා විසින් නියම කරනු ලැබූ විට, ලේකම්වරයා විසින් මණ්ඩලයේ සියලු රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය. ඒ මණ්ඩලය විසින් පවත්වනු ලබන රැස්වීම් පිළිබඳ වාර්තා, ලේකම්වරයා විසින් තබා ගත යුතු ය.

මණ්ඩලයක කර්තව්‍යය.

8. (1) පාසලක් සඳහා පිහිටුවන ලද මණ්ඩලයක කර්තව්‍ය, එම පාසලේ සංවර්ධනයට සම්බන්ධ කාරණාවල දී විදුහල්පතිවරයාට හෝ ඔහු නොමැති විට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විදුහල්පතිවරයාට උපදෙස් දීම හා උපකාරවීම සහ පහත දැක්වෙන දේ ඉටු කිරීම විය යුතු ය :—

(අ) පාසැලේ තත්කාලීන අවශ්‍යතා සහ කාර්ය සාධනය ඇගයීම සහ ඊට සහායවීම, අධ්‍යාපන විෂය මාලාවට සහ ඉගැන්වීමේ ක්‍රම පිළිබඳව වැඩි දියුණු කිරීම් ජාතික අධ්‍යාපන ආයතනයට නිර්දේශ කිරීම සහ දෙමව්පියන්, ගුරුවරුන් සහ පාසලේ ශිෂ්‍යයන් අතර වැඩිමනත් සහයෝගිතාවය ප්‍රවර්ධනය කිරීම;

(ආ) පාසලේ ක්‍රීඩා සහ විනෝද, සාහිත්‍ය සෞන්දර්ය, සමාජ, වෘත්තිය හා වෙනත් විෂය බාහිර ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) පාසලේ සංස්කෘතික, (අන්තර් සංස්කෘතික සහ අන්තර් ආගමික කටයුතු ඇතුළුව) ආගමික සහ සදාචාර කටයුතු ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) පාසලේ උපව්‍යුහය සංවර්ධනය කිරිමෙහි සහ නඩත්තු කිරිමෙහි ලා සහාය වීම ;

(ඉ) පුස්තකාල, අධ්‍යාපනික උපකරණ හා අනිකුත් අධ්‍යාපන ආධාරක සම්බන්ධයෙන් පාසලේ පහසුකම් වැඩිදියුණු කිරිමෙහි සහ ව්‍යාප්ත කිරීමෙහි ලා සහාය වීම ;

(ඊ) පාසලට පාසල් පොත්, දිවා ආහාර මුද්දර, ශිෂ්‍ය නිල ඇඳුම් පිළිබඳ අවශ්‍යතා නිශ්චය කිරීම සහ ඒවා බෙදා දීම ;

(උ) පාසල් ප්‍රජාවේ අනන්‍යතාව සහ සම්ප්‍රදාය ආරක්ෂාකර ගැනීමේ අදහසින් පාසල් ප්‍රජාවේ ශුභසාධක කටයුතු දියුණු කිරීම සහ ශක්තිමත් කිරීම ;

(ඌ) එක් අතකින් පාසල ද අනික් අතින් ප්‍රජාව සහ ආගමික ආයතන ද අතර සංයුක්ත සම්බන්ධතාවක් ඇති කිරීම සඳහා සන්නිවේදන මාධ්‍ය සමග ඵලදායි ලෙස අන්‍යෝන්‍ය වශයෙන් කටයුතු කිරීම ;

(එ) රජයෙන් වෙන්කර දෙන ලද මුදල්වල සහ ප්‍රජාවගෙන් ලැබෙන ආධාර මුදල්වල උපරිම ප්‍රයෝජනය, පාසල විසින් ලබා ගැනීම සම්බන්ධයෙන් සහායවීම සහ ඒ මුදල් නිසි ලෙස විය පැහැදම් කිරීමට අවශ්‍ය පියවර ගැනීම ;

(ඒ) පාසල් ප්‍රජාවේ සාමාජිකයන්ට රැකවරණය සැලසීමේ සහ ඔවුන් සමග බෙදාහදාගැනීමේ ආධ්‍යාසය, එකමුතුකම හා සංවිධාන ශක්තිය පාසලේ ශිෂ්‍යයන්ට ලබාදීමේ අදහසින් එම ශිෂ්‍යයන්ගේ පෞරුෂතා වර්ධනයට සහාය වීම.

(2) පාසලේ යම් ශාස්ත්‍රීය, පරිපාලන, සේවා මණ්ඩලීය හෝ විනය කාරණයක් සම්බන්ධයෙන් යම් නිශ්චිත තීරණයක් ගැනීමට එම පාසලේ විදුහල්පතිවරයාට නියම කිරීමට, පාසලක් සඳහා පිහිටුවන ලද මණ්ඩලයකට, (1) වන උපවගන්තියේ සඳහන් කිසිවකින් බලය ලැබෙන ලෙස නොසැලකිය යුතු ය.

9. (1) සෑම පාසලක් සඳහාම, මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් අනුකමිටු, (6) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, සංස්ථාපනය කළ යුතුය. එසේ සංස්ථාපනය කරන ලද අනුකමිටුවල කර්තව්‍ය එම පාසල සඳහා පිහිටුවන ලද මණ්ඩලයට, එම උපලේඛනය මගින් එම අනුකමිටුවලට පවරා දෙන ලද කාරණා සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම විය යුතු ය. අනුකමිටු.

(2) පාසලක් සඳහා සංස්ථාපනය කරන ලද එක් එක් අනුකමිටුව යටත් පිරිසෙයින් සාමාජිකයන් තුන් දෙනකුගෙන් සමන්විත විය යුතු අතර ප්‍රායෝගිකව කළ හැකි තාක් දුරට එම පාසලේ ගුරුවරු යකු, එම පාසලේ ශිෂ්‍යයකුගේ දෙමව්පියකු සහ එම පාසලේ ආදි ශිෂ්‍යයකු ඊට ඇතුළත් විය යුතු ය.

(3) (7) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, පාසලක් සඳහා පිහිටුවන ලද මණ්ඩලයක සාමාජිකයකු මේ වගන්තිය යටතේ එම පාසල සඳහා සංස්ථාපනය කරන ලද අනුකමිටුවක සාමාජිකයකු වශයෙන් තෝරාපත්කර ගැනීමට හෝ නම් කරනු ලැබීමට නුසුදුස්සකු විය යුතු ය.

(4) එක් එක් අනුකමිටුවේ සාමාජිකයන්, ඒ පාසල සඳහා පිහිටුවන ලද මණ්ඩලයේ සාමාජිකයන් තෝරාපත්කර ගැනීම සඳහා, පිළිවෙලින් 3 වන වගන්තියේ (ආ) ඡේදයේ (i) (ii), සහ (iii) වන අනුඡේද යටතේ පවත්වනු ලබන රැස්වීම්වල දී තෝරා පත්කර ගනු ලැබිය යුතු ය.

(5) යම් පාසලක් සඳහා පත් කරන ලද යම් අනුකමිටුවක ක්‍රියාකාරකම අනුව එම අනුකමිටුවට අතිරේක සාමාජිකයන් වුවමනා වන බව එම පාසල සඳහා පත් කරන ලද මණ්ඩලයේ අදහස වේ නම්, එම මණ්ඩලය විසින් එම අනුකමිටුවේ සාමාජික සංඛ්‍යාව වැඩි කළ හැකි ය. එසේ සාමාජික සංඛ්‍යාව වැඩි කිරීමේ දී, එම පාසලේ ගුරුවරුන්, එම පාසලේ ශිෂ්‍යයන්ගේ දෙමව්පියන් සහ එම පාසලේ ආදි ශිෂ්‍යයන් හැකිතාක් දුරට එම අනුකමිටුවේ සමාන ලෙස නියෝජනය වන බවට වගබලා ගැනීමට මණ්ඩලය උත්සාහ කළ යුතු ය.

(6) පාසලක් සඳහා යම් අනුකමිටුවක් සංස්ථාපනය කිරීමට ප්‍රමාණවත් තැනැත්තන් සංඛ්‍යාවක් නොසිටින විට හෝ පාසලක ක්‍රියාකාරකම් අනුව මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් සියලුම අනුකමිටු සංස්ථාපනය කිරීම අවශ්‍ය නොවන විට, එම පාසල සඳහා පිහිටුවන ලද මණ්ඩලය විසින්, එම පාසලේ ක්‍රියාකාරකම්වලට සැලකිය යුතු සංඛ්‍යාවක් අනුකමිටු පත් කළ හැකි අතර, මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් අනුකමිටුවල කර්තව්‍ය, එසේ සංස්ථාපනය කරන ලද අනුකමිටුවලට නැවත වෙන් කර දිය යුතු ය.

(7) පාසලක් සඳහා පිහිටුවන ලද මණ්ඩලය විසින් නම් කරන ලද ඒ මණ්ඩලයේ සාමාජිකයකු, ඒ පාසල සඳහා පත් කරන ලද අනුකමිටුවක සෑම රැස්වීමක ම මූලාසනය දැරිය යුතු ය.

(8) පාසලක් සඳහා සංස්ථාපනය කරන ලද අනුකමිටුවක් යටත් පිරිසෙයින් එක් මසකට එක් වරක් හෝ රැස්විය යුතු ය.

(9) පාසලක් සඳහා සංස්ථාපනය කරන ලද අනුකමිටුවක යම් රැස්වීමක් සඳහා ගණපූරණය සභාපතිවරයා ඇතුළුව, සාමාජිකයන් තුන් දෙනකු විය යුතු ය.

(10) පාසලක් සඳහා සංස්ථාපනය කරන ලද අනුකමිටුවක සියලු නිර්දේශ සහ තීරණ එම පාසල සඳහා පිහිටුවන ලද මණ්ඩලය විසින් සලකා බැලීම සඳහා ඒ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

පාසල් සංවර්ධන අරමුදල.

10. (1) පාසලක් සඳහා පිහිටුවන ලද සෑම මණ්ඩලයක් විසින් ම "පාසල් සංවර්ධන අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) පාසල් සංවර්ධන මණ්ඩලයට, ආණ්ඩුවෙන් හෝ යම් පළාත් සභාවකින් හෝ ලැබෙන සියලු මුදල්, මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව පහසුකම් ගාස්තු වශයෙන් ඒ පාසල විසින් අය කරනු ලබන සියලු මුදල්, ඒ පාසලට ආධාර වශයෙන් පවත්වන ව්‍යාපෘති මගින් එකතු කරන සියලු මුදල් සහ පාසලෙහි ශුභසිද්ධිය පතන්නන්ගෙන් ස්වේච්ඡාවෙන් ලැබෙන සියලු දායක මුදල් ඒ මණ්ඩලය විසින් පවත්වාගෙන යන පාසල් සංවර්ධන අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) එම මණ්ඩලය විසින් (2) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන පාසල් සංවර්ධන අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් සහ ආධාර මුදල්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූල යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක, එම මණ්ඩලයේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු ය.

(4) පාසලක් සඳහා පිහිටුවන ලද මණ්ඩලයක් විසින් පවත්වාගෙන යනු ලබන පාසල් සංවර්ධන අරමුදලේ ඇති මුදල්, උචිත අධ්‍යාපන බලධරයා විසින් නියම කරනු ලබන යම් ගුරු උපදේශ ඇත් නම් ඒවාට යටත්ව, එම පාසලේ සංවර්ධනය සඳහා උපයෝගී කරගත හැකි ය.

(5) එම මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන පාසල් සංවර්ධන අරමුදලට දෙන සෑම ආධාර මුදලක් ම, ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලකට මුදලින් කළ පරිත්‍යාගයක් ලෙස, 1979 අංක 28 දරන දේශිය ආදායම් පනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

11. (1) පාසලක් සඳහා පිහිටුවන ලද සෑම මණ්ඩලයකම, 3 වන වගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදය යටතේ තෝරා පත් කර ගන්නා ලද ඒ මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් මණ්ඩලය විසින් තෝරා පත් කර ගන්නා ලද භාණ්ඩාගාරිකවරයකු විය යුතු ය. මණ්ඩලයේ භාණ්ඩාගාරිකවරයා.

(2) මණ්ඩලය විසින් 10 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන පාසල් සංවර්ධන අරමුදලේ ලැබීම් හා වියදම් පිළිබඳව සහ ඒ අරමුදලේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීමට භාණ්ඩාගාරිකවරයා විසින් සැලැස්විය යුතු ය. ඒ සියලු ගිණුම් පොත්, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ පළාත් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධරයන් විසින් පරීක්ෂා කිරීම සඳහා විවෘතව තිබිය යුතු ය.

(3) පාසලක් සඳහා පිහිටුවන ලද මණ්ඩලයක් විසින් අනුමත කරන ලද යම් වියදමක් දැරීම සඳහා මුදල් ආපසු ගැනීම පිණිස වූ සියලු චෙක්පත් භාණ්ඩාගාරිකවරයා විසින් සහ සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් අත්සන් කළ යුතු ය.

(4) මණ්ඩලය විසින් 10 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන පාසල් සංවර්ධන අරමුදලේ සියලු ගිණුම්, එම මණ්ඩලය විසින් පත් කරන ලද විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය. ඒ අරමුදලේ ගිණුම්, ඒ විගණනය අදාළ වන ලිත් වර්ෂය අවසාන වී මාස දෙකක් ඇතුළත ඒ මණ්ඩලයේ භාණ්ඩාගාරිකවරයා විසින් ඒ විගණකවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ විගණකවරයා විසින් ඒ ලිත් වර්ෂය අවසාන වී මාස හතරක් ඇතුළත ඒ විගණනය පිළිබඳ වාර්තාවක් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය. ඒ විගණනය කළ ගිණුම් ලැබී එක් මාසයක් ඇතුළත මණ්ඩලය විසින් එය පළාත් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(5) මේ වගන්තියෙහි ඇතුළත් කිසිවක්, යම් ලිඛිත නීතියකින් විගණකාධිපතිවරයාට පැවරී ඇති බලතල හීන කරන්නක් ලෙස කියවීම හෝ තේරුම් ගැනීම නොකළ යුතු ය.

මණ්ඩලය විසුරුවා හැරීම සහ නැවත සංස්ථාපනය කිරීම.

12. (1) 3 වන වගන්තිය යටතේ පාසලක් සඳහා පිහිටුවන ලද මණ්ඩලයක් මේ පනතින් ඊට වෙන් කර දෙන ලද කර්තව්‍ය ඉටු නොකරන බවට හෝ ඵලදායක ලෙස ඉටු නොකරන බවට උචිත අධ්‍යාපන බලධරයා සෑහීමට පත්වන අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ඔහු විසින් එම මණ්ඩලය විසුරුවා හරිනු ලැබිය හැකි අතර, 3 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව එම පාසල සඳහා අලුත් මණ්ඩලයක් සංස්ථාපනය කිරීමට සැලැස්විය යුතු ය.

(2) පාසලක් සඳහා පිහිටුවන ලද මණ්ඩලයක් විසුරුවා හරින ලද අවස්ථාවක දී, එම පාසල සඳහා අලුත් මණ්ඩලයක් සංස්ථාපනය කරන තෙක්, නිශ්චිත පාසලක් සම්බන්ධයෙන් වන විට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ද වෙනත් යම් පාසලක් සම්බන්ධයෙන් වන විට කොට්ඨාස නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ද, මේ පනතින් ඒ මණ්ඩලයට වෙන් කර දෙන ලද කර්තව්‍ය ඉටු කළ යුතු ය.

නියෝග.

13. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම හෝ බලගැන්වීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දින යේ දී හෝ එම නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ පසු, හැකි තාක් ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලබන සෑම නියෝගයක් ම එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු නමුදු ඒ යටතේ කලින් කරන ලද කිසි දෙයක වලංගුභාවයට එයින් හානියක් නොවිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන.

14. (1) නියමිත දිනයේ දී යම් පාසලක, මේ පනතෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයට පිහිටුවන ලද හෝ සංස්ථාපනය කරන ලද පාසල් සංවර්ධන මණ්ඩලයක් සහ අනුකමිටු ඇත්තා වූ ද, එම මණ්ඩලය හෝ අනුකමිටු උචිත අධ්‍යාපන බලධරයා විසින් ලිඛිතව පිළිගනු ලබන්නාවූද අවස්ථාවක, එම මණ්ඩල සහ අනුකමිටු මේ පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද සහ සංස්ථාපනය කරන ලැබූ ලෙස සළකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පිළිගත් මණ්ඩලයක හෝ අනුකමිටුවක, නියමිත දිනයේ දී ධුරය දරන සෑම සාමාජිකයකු ම නියමිත දිනයේ සිට ගණන් බලනු ලබන අවුරුදු තුනක කාලයක්, අවස්ථාවෝචිත පරිදි, ඒ මණ්ඩලයේ අනුකමිටුවේ නොකඩව ධුරය දැරිය යුතු ය.

(3) එවැනි යම් මණ්ඩලයකට හෝ අනුකමිටුවකට, මේ පනතින් මණ්ඩලයකට හෝ අනුකමිටුවකට වෙන් කර දෙන ලද කර්තව්‍ය ඉටු කළ හැකිවීම සඳහා අවශ්‍ය හෝ සුදුසු යැයි උචිත අධ්‍යාපන බල ධරයාට පෙනී යන්නා වූ ද මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන්නාවූද උපදෙස් ඔහු විසින් දිය හැකි ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

15. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූල තාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"උචිත අධ්‍යාපන බලධරයා" යන්නෙන්—

(අ) නිශ්චිත පාසලක් සම්බන්ධයෙන් වූ විට, අමාත්‍යවර යාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම් වරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් නිලධරයකු අදහස් වේ ;

(ආ) වෙනත් යම් පාසලක් සම්බන්ධයෙන් වූ විට, පළාත් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් වරයා හෝ ඒ ලේකම්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් නිලධරයකු අදහස් වේ ;

"කොට්ඨාස නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ" යන්නෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා යටතේ පළාතක කොට්ඨාසයක අධ්‍යාපනය භාරව සිටින නිලධරයා අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් විසින් ඉටු කරන බලතලවලට, කාර්ය වලට සහ කර්තව්‍යවලට අනුරූප වන හෝ සමාන වන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා යම් නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද්දා වූ ද අධ්‍යාපන විෂයය භාර දෙනු ලැබ ඇත්තා වූ ද අමාත්‍යවරයා අදහස් වේ ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154අ ව්‍යවස්ථාව මගින් පිහිටුවා ඇති පළාත් සභාවක් අදහස් වේ ;

"පළාත් අධ්‍යක්ෂවරයා" යන්නෙන් පළාතේ අධ්‍යාපන කටයුතු භාර නිලධරයා අදහස් වේ;

"පළාත් අමාත්‍යවරයා" යන්නෙන්, පළාතක අමාත්‍ය මණ්ඩලයේ අධ්‍යාපන විෂයය පවරා දී ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විදුහල්පතිවරයා" යන්නට, පාසලක විදුහල්පතිවරයා නොමැති විට එම පාසලේ විදුහල්පතිවරයාගේ කාර්ය ඉටු කිරීම සඳහා එම පාසලේ විදුහල්පතිවරයා විසින් හෝ උචිත අධ්‍යාපන බලධරයා විසින් බලය දෙන ලද ඒ පාසලේ ගුරු මණ්ඩලයේ සාමාජිකයකු ඇතුළත් වේ;

"පාසල" යන්නෙන්, රජයේ පාසලක් අදහස් වේ;

"නිශ්චිත පාසල" යන්නෙන් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ජාතික පාසලක් ලෙස වර්ග කරන ලද පාසලක් අදහස් වේ.

(9 වන වගන්තිය)

## උපලේඛනය

(අ) අධ්‍යාපන සංවර්ධන අනුකමිටුව
8(අ) වගන්තියෙහි සඳහන් කාරණා සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා.

(ආ) විෂය කටයුතු අනුකමිටුව
8(ආ) වගන්තියෙහි සඳහන් කාරණා සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා.

(ඇ) සදාචාර සංවර්ධන අනුකමිටුව
8(ඇ) වගන්තියෙහි සඳහන් කාරණා සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා.

(ඈ) භෞතික සම්පත් අනුකමිටුව
8(ඈ) වගන්තියෙහි සඳහන් කාරණා සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා.

(ඉ) පුස්තකාල සහ අධ්‍යාපනික උපකරණ අනුකමිටුව
8(ඉ) වගන්තියෙහි සඳහන් කාරණා සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා.

(ඊ) පාසල් පොත්, දිවා ආහාර සහ නිල ඇඳුම් අනුකමිටුව
8(ඊ) වගන්තියෙහි සඳහන් කාරණා සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා.

(උ) ශුභසාධක සහ ප්‍රජා සම්බන්ධතා අනුකමිටුව
8(උ) වගන්තියෙහි සඳහන් කාරණා සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා.

(ඌ) සන්නිවේදන අනුකමිටුව
8(ඌ) වගන්තියෙහි සඳහන් කාරණා සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා.

(එ) මුදල් අනුකමිටුව
8(එ) වගන්තියෙහි සඳහන් කාරණා සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා.

(ඒ) ශිෂ්‍ය පෞරුෂ වර්ධන අනුකමිටුව
8(ඒ) වගන්තියෙහි සඳහන් කාරණා සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා.